# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1987/21 - 2016 ඔක්තෝබර් මස 05 වැනි බදාදා - 2016.10.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත**

3 වන වගන්තිය යටතේ නියමය

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, මෙහි පළමුවන උපලේඛනයේ දක්වා ඇති දැනටමත් නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශය පළමු උපලේඛනයේ I වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, එම ලේඛනයේ II වැනි තීරුවෙහි තදානුරූපීව මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා අත්තා වූ ද ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, එම ප්‍රදේශය එම වගන්තියේ කාර්යය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

පාඨලී චම්පික රණවක,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 20 වැනි දින,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,
17 සහ 18 මහල්, ''සුහුරුපාය''
සුහුතිපුර පාර, බත්තරමුල්ල.

උපලේඛනය 1

*රක්වාන නාගරික බල ප්‍රදේශය*

*I වැනි තීරුව*

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටියා වූ 231 බී රක්වාන නගරය, 231 රක්වාන උතුර (කොටසක්), 231 සී රක්වාන දකුණ (කොටසක්), 231 ඩී කොට්ටල (කොටසක්), 231 ඒ වෙරළුගහමුල (කොටසක්) සහ 237 මස්ඉඹුල (කොටසක්) යන ග්‍රාම නිලධාරි කොට්ඨාසවලට අයත්වන්නා වූ ගොඩකවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි II වැනි තීරුවේ විස්තර වන ඉම් සලකුණු සහ මායිම්වලින් සමන්විත වූ මුළු මහත් භූමි ප්‍රදේශය.

*II වැනි තීරුව*

**උතුර** :- දෙමුවත් ගඟේ මධ්‍ය රේඛාව සහ ලියනගොඩ මාර්ගයේ මධ්‍ය රේඛාව එකිනෙකට ඡේදනය වන ලක්ෂ්‍යයෙන් ආරම්භ වී ලියනගොඩ මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ඊසාන සහ නැගෙනහිර දෙසට ඇඳි රේඛාව මාදම්පෙ - දෙනියාය - ගාල්ල (ඒ 17) ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය වන ලක්ෂ්‍යය දක්වාද ; එතැන් සිට එකී ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ගිනිකොණ, දකුණ, නැගෙනහිර සහ නැවතත් දකුණ දෙසට ඇඳි රේඛාව මාදම්පෙ - දෙනියාය - ගාල්ල (ඒ 17) ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව සහ ඩැල්වින් වත්ත මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය කරන ලක්ෂ්‍යය දක්වාද ; එතැන් සිට ඩැල්වින් වත්ත මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණ, නැගෙනහිර, ගිණිකොණ, ඊසාන සහ නැවතත් ගිණිකොණ දෙසට ඇඳි රේඛාව රක්වාන - මස්ඉඹුල - ගොඩකවෙල




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උතුර** :- *(සම්බන්ධිතයි)*

මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය කරන ලක්ෂ්‍යය දක්වාද ; එතැන් සිට රක්වාන - මස්ඉඹුල - ගොඩකවෙල මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ඊසාන, උතුර නැවතත් ඊසාන සහ නැගෙනහිර දෙසට ඇදි රේඛාව කරුණාරත්නගම මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය කරන ලක්ෂ්‍යය දක්වාද,

**නැගෙනහිර** :- අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට කරුණාරත්නගම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණ සහ ගිනිකොණ දෙසට ඇදි රේඛාව කැන්දපොළ මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය කරන ලක්ෂ්‍යය දක්වාද ; එතැන් සිට කැන්දපොළ මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ඊසාන, නැගෙනහිර, ගිනිකොණ සහ නැවතත් ඊසාන දෙසට ඇදි රේඛාව රක්වාන ගඟේ මධ්‍ය රේඛාව ඡේදනය කරන ලක්ෂ්‍යය දක්වාද ; එතැන් සිට රක්වාන ගඟේ මධ්‍ය රේඛාව ඔස්සේ ගිනිකොණ, නිරිත, වයඹ, ගිනිකොණ, නැවතත් නිරිත, වයඹ, බටහිර සහ දකුණ දෙසට ඇදි රේඛාව ගල්දොලේ මධ්‍ය රේඛාව ඡේදනය කරන ලක්ෂ්‍යය දක්වාද ; එතැන් සිට එකී දොලේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණ, නිරිත, ගිනිකොණ, බටහිර සහ දකුණ දෙසට ඇදි රේඛාව මාදම්පෙ - දෙනියාය - ගාල්ල (ඒ 17) ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය කරන ලක්ෂ්‍යය දක්වාද,

**දකුණ** :- අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට මාදම්පෙ - දෙනියාය - ගාල්ල (ඒ 17) ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර, උතුර, වයඹ සහ නිරිත දෙසට ද නැවතත් වයඹ, නිරිත සහ වයඹ දෙසට රක්වාන ගඟේ මධ්‍ය රේඛාව ඡේදනය කරමින් ඇදි රේඛාව ඇලටන් වත්ත මාර්ගයේ මධ්‍යම රේඛාව ඡේදනය කරන ලක්ෂ්‍යය දක්වාද ; එතැන් සිට ඇලටන් වත්ත මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර, උතුර, වයඹ සහ නැවතත් උතුර දෙසට ඇදි රේඛාව රක්වාන - පොතුපිටිය - කලවාන (බී 181) මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය කරන ලක්ෂ්‍යය දක්වාද ; එතැන් සිට රක්වාන - පොතුපිටිය - කලවාන (බී 181) මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ නිරිත, දකුණ සහ බටහිර දෙසට ඇදි රේඛාව කන්දෙගම - ගංගොඩ මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය කරන ලක්ෂ්‍යය දක්වාද,

**බටහිර** :- අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට කන්දෙගම - ගංගොඩ මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ වයඹ, නිරිත, වයඹ නැවතත් එකී මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර, වයඹ, උතුර, නැගෙනහිර සහ ඊසාන දෙසට ඇදි රේඛාව රක්වාන - ගංගොඩ - පන්නිල මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය කරන ලක්ෂ්‍යය දක්වාද ; එතැන් සිට රක්වාන - ගංගොඩ - පන්නිල මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ගිනිකොණ, ඊසාන, නැගෙනහිර නැවතත් ඊසාන සහ දකුණ දෙසට ඇදි රේඛාව කොට්ටල දොලේ මධ්‍ය රේඛාව ඡේදනය කරන ලක්ෂ්‍යය දක්වාද ; එතැන් සිට කොට්ටල දොලේ මධ්‍ය රේඛාව ඔස්සේ ඊසාන, උතුර නැවතත් ඊසාන සහ වයඹ දෙසට ඇදි රේඛාව අනක දොලේ මධ්‍ය රේඛාව ඡේදනය කරන ලක්ෂ්‍යය දක්වාද ; එතැන් සිට කොට්ටල දොලේ මධ්‍ය රේඛාව ඔස්සේ වයඹ, උතුර, බටහිර, වයඹ සහ නැවතත් බටහිර දෙසට ඇදි රේඛාව දෙමුවත් ගඟේ මධ්‍ය රේඛාව ඡේදනය කරන ලක්ෂ්‍ය දක්වාද ; එතැන් සිට දෙමුවත් ගඟේ මධ්‍ය රේඛාව ඔස්සේ වයඹ දෙසට අඳින ලද රේඛාව ආරම්භක ලක්ෂ්‍යය හමුවන ස්ථානය දක්වාද වේ.

10 - 662

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.